ආයතනයේ නම : තැපැල් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද
වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු
අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் : தபால் திணைக்களம்

பாராளுமன்ற அரசாங்க கணக்குக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை
தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119 (4) கீழ்
கௌரவ அமைச்சரின் அவதானிப்பு மற்றும் எடுக்கப்பட்ட
நடவடிக்கைகள் பாராளுமன்றத்திற்கு முன்வைத்தல்.

Name of the Institution : Department of Post

Submission of observations of Hon Minister and Steps Taken with Regard To the Reports Tabled by The Committee on Public Account in Terms of Standing Ordrer No 119(4)

ආකෘතිය (අංක 01)
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 183
ආයතනය - තැපැල් දෙපාර්තමේන්තුව

පළමු කොටස :82.00		
අනු අංක	හඳුනාගෙන ඇති අඩුපාඩුව	අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
01.	හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පිළිබඳ ලේඛණයක් පවත්වාගෙන යයි
02.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබීම.	ප්‍රශ්න ගත 2020 වර්ෂයට සාපේක්ෂව පිළිතුරු ගෙන්වා ගැනීමේ ප්‍රගතියක් 2021 වර්ෂයේ පෙන්නුම් කර ඇත. මේ වන විට ප්‍රමාදයන් වලක්වා ගැනීමට අභ්‍යන්තර වැඩ පිලිවෙළක් සකසා ඇත.
03.	මු.රෙ.134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම.	අභ්‍යන්තර විගණන විමසුම් වල සියළුම පිටපත් විගණන අධිකාරී (තැපැල්) වෙත යොමු කරනු ලැබේ.
04.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා පිළිබඳව වන නිර්දේශ නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	01. තැපැල් දෙපාර්තමේන්තුවයටතේ ඇති තැපැල් කාර්යාල 653ක, උපතැපැල් කාර්යාල 3410ක සහ පාලන කාර්යාල 80ක භාණ්ඩ සමීක්ෂණ කටයුතු වාර්ෂිකව සිදු කරනු ලබයි. 02. එමෙන්ම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන්, සහ වාර්ෂික ගබඩා සමීක්ෂණයෙන් පසු ඇතිවන අතිරික්තයන් හා ඌනතාවයන් වාර්ෂිකව හඳුනාගනු ලබයි. 03. මෙම දෙපාර්තමේන්තුව දිවයින පුරා විසිරී ඇති හෙයින්ද,දැනට සේවක පුරප්පාඩු සැලකිය යුතු ප්‍රමාණයක් පවතින හෙයින්ද, කොවිඩ් 19 උවදුර හේතුවෙන්ද, බොහොමයක් ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු දෛනිකව පවත්වාගත නොහැකි වීම හේතුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ අතිරික්ත හා ඌනතා පිළිබඳව වන නිර්දේශ මෙන්ම අනෙකුත් නිර්දේශයන්ද නියමිත කාල රාමුව තුල ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. 04. 2022 වසරේ වාර්ෂික භාණ්ඩ/ගබඩා සමීක්ෂණ කටයුතු ජනවාරි මස සිට ආරම්භ කර ඇති අතර, එම කටයුතු ඉටු කරන නිලධාරීන් වෙත අතිරික්ත හා ඌනතා විශේෂයෙන් වාර්තා කරන ලෙස ලිඛිතව දැනුම් දීමට කටයුතු කර ඇත. ඊට අමතරව වාර්ෂික ගබඩා/භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා අපහරණ කටයුතු අදාල කාල රාමුව තුලම සිදු කරන ලෙස සියලුම ප්‍රාදේශීය කාර්යාල උපදෙස් ලිපි මඟින් දැනුවත් කර ඇත. 05. ඒ අනුව ඉදිරියේදී නියමිත කාල රාමුව තුල අදාළ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.
05.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික වාර්තා විගණකාධිපති වෙත වාර්තා කර නොතිබීම	කොරෝනා වසංගත තත්වයට අප රටද මුහුණ දීමට සිදුවූ කාල පරිච්ඡේදයක තැපැල් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයද එම වසංගත රෝග තත්වයට වරින්වර ගොදුරු වූ හෙයින් කාර්ය මණ්ඩල ඌනතාවයත් සමඟ දැඩි අසිරුතාවයන් මත තැපැල් මෙහෙයුම් කටයුතු සිදු කිරීමට සිදුවිය.මෙහිදී කාර්යය මණ්ඩල ඌනතාවයත් සමඟ ඇතිවූ

		දුෂ්කරතාවයක් මත 2020 වර්ෂයට අදාල සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික වාර්තා විගණකාධිපති වෙත ලබා දීමට නොහැකි වී ඇත. 2021වර්ෂයේ සිට සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා කාර්තු වාර්තා නියමිත කාලය තුලදී ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි .
06.	වාහනයක් ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවෙහි මේ වන විට අපහරණ තත්වයේ ඇති එක් වාහනයක් පවතී. 16ශ්‍රී 6905 අංක දරණ එම වාහනය අපහරණය කිරීම සඳහා එහි ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඇතුලත් විශේෂ කොන්දේසි අවලංගු කර ගත යුතුව ඇති අතර ඒ සඳහා මෙම විශේෂ කොන්දේසි ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ඉල්ලා ඇත.
07.	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබීම	මෙම ගිණුම වසා දැමීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නැවත වරක් ආකෘති පත්‍ර සකස් කර 2021.12.01 දින ලබා දී ඇති අතර මේ සම්බන්ධව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විමසූ විට කඩිනමින් ගිණුම වසා දැමීමට කටයුතු කරන බව දන්වා ඇති බව දන්වා සිටිමි.
08.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	මේ වන විට අදාල ශේෂ හඳුනාගෙන ගැලපුම් කර නිවැරදි කර ඇත.
09.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	2022.12.31 දිනට පැවති වර්ෂයකට වඩා වැඩි හිඟ ණය ශේෂ වන රු.38,336,519.80 න් රු.2,275,444.80 ක් මේ වන විට අයකරගැනීමට කටයුතු කර ඇත. තවද, රු.1,358,906.31 ක තවදුරටත් අයකර ගැනීමට නොහැකි රු.25,000.00 ට අඩු හිඟ ණය ශේෂ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව 2022.12.23 දිනැතිව කපා හැරීමට කටයුතු කර ඇත. වර්ෂයකට වඩා වැඩි තවදුරටත් පවතින හිඟ ණය ශේෂ අයකරගැනීමට අදාලව විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. වැඩ තහනම් නිලධාරීන් සහ සේවය හැරගිය නිලධාරීන්ගෙන් හඳුනාගත් නිලධාරීන්ට ලිපි මඟින් ණය ගෙවන ලෙසට දන්වා යවා ඇත. ඇතැම් නිලධාරීන් මේ සඳහා ප්‍රතිචාර දක්වා නොමැති අතර නිලධාරීන් කිහිපදෙනෙකු මේ වන විට කොටස් වශයෙන් ගෙවීම් කරමින් පවතී. තවදුරටත් ලිපි ලැබී ප්‍රතිචාර නොදැක්වූ ණයකරුවන්ගේ ඇපකරුවන් පිළිබඳ තොරතුරු පාලන ලේකම් (කාර්ය මණ්ඩල) වෙතින් ලබා ගෙන ඇපකරුවන් වෙත ලිපි යොමු කර ඇත. ඉන් ප්‍රතිචාර ලැබී නොමැති, තැපැල් දෙපාර්තමේන්තුවේ දැනටමත් සේවයේ යෙදී සිටින ඇපකරුවන්ගේ වැටුපෙන් මාසිකව අදාළ ණය ශේෂයන් අයකරගැනීම සිදු කරමින් පවතී. ඇපකරුවන් නොමැති ණයකරුවන්ගේ වත්කම් පිළිබඳ තහවුරුවක් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබා ගැනීමට අදාලව කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එසේම ඇතැම් ණය ශේෂ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කර ඇත.

	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	තැපැල් දෙපාර්තමේන්තුවේ අනුමත නියෝජ්‍ය තැපැල්පති තනතුරු සංඛ්‍යාව 13ක් වන අතර ඉන් 4ක් ශ්‍රීලංකා පරිපාලන සේවයේ තනතුරු මගින් පිරවීම සිදු කෙරේ. ඒ අනුව දෙපාර්තමේන්තුගත තනතුරු 09ක් වේ. දෙපාර්තමේන්තුව තුලින් නියෝජ්‍ය තැපැල්පති වරුනට උසස්වීම් ලබා දෙනු ලබන්නේ විධායක II ශ්‍රේණියේ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව වේ. රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 6/2006 අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටි ප්‍රකාරව ශ්‍රේණි උසස්වීම් ක්‍රම වේදය මත නියෝජ්‍යය කැපැල්පති තනතුර සඳහා නිළධාරීන් 02නෙක් සුදුසුකම් ලබා තිබුණි. පුරප්පාඩු තනතුරු 02ක් සඳහා රාජ්‍ය පරිපාලන සේවයේ සුදුසුකම් ලත් නිළධාරීන් අයදුම් නොකල බැවින් එම තනතුරු 02 සඳහා දෙපාර්තමේන්තුවේ සුදුසුකම් ලත් නිලධාරීන් යෙදවීමට සිදු විය. ඒ අනුව තනතුරු සංඛ්‍යාව 11ක් වී ඇති බව පෙන්වා දෙමි. තැපැල්සේවා නිළධාරී 1 ශ්‍රේණියේ අනුමත කාර්ය මණ්ඩලය 876ක් වේ. රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 6/2006 අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටි අනුව ශ්‍රේණි උසස්වීම් ක්‍රමවේදය මත I ශ්‍රේණිය සඳහා සුදුසුකම් ලබන සියලුම නිලධාරීන්ට උසස්වීම් ලබාදීම සිදු කල යුතු බැවින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා උසස් වීම ප්‍රධානය කර ඇත.

දෙවන කොටස : 55		
අනු අංක	**හඳුනාගෙන ඇති අඩුපාඩුව**	**අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**
01.	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබීම.	මෙම පහසුකම් සහිතව නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම 2023 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත.
02.	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා අයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙළ කිරීම 2023 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත.මෙහෙයුම් කාර්යාල, ගිණුම් කාර්යාල හා පාලන කාර්යාල ලෙස අංශ 03කට අදාලව විශාල කාර්ය භාරයක් එක් එක් සේවා වාරය මගින් ඉටු කරනු ලැබේ. එම නිසා එකී සියලු අංශ ආවරණය වන පරිදි වෙන වෙනම සේවාලාභී ප්‍රඥාප්ති සකස් කළ යුතු වේ. ප්‍රායෝගික ගැටළුව වී ඇත්තේ අධික කාර්ය මණ්ඩල හිඟය නිසා සේවාලාභී ප්‍රඥාප්ති සකස් කළ ද නියමිත කාල වේලාව තුළ අදාල කාර්යයන් නිම කිරීම ගැටළු සහගත වීමයි. කෙසේ වුවද සේවාලාභී ප්‍රඥාප්ති සකස් කිරීම ආරම්භ කර ඇත. එහෙත් ප්‍රසිද්ධ කර ක්‍රියාත්මක කළ හැකි වන්නේ කාර්ය මණ්ඩල හිඟය සපුරා ගත් පසුය. නැතහොත් සේවාලාභීන්ගේ අතෘප්තියට එය හේතු වනු ඇත. කාර්ය මණ්ඩලය සපුරා ගෙන මෙය ක්‍රියාත්මක කිරීමෙන් පසු අධීක්ෂණය හා ඇගයීම නිසි ලෙස කළ හැකිය.

03.	රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	විධිමත් මානව සම්පත් සැලැස්මක් මේ වන විට සකසා නැත. එසේ වුවද මානව සම්පත් සැලැස්මට අදාල සියලුම කාර්යයන් විවිධ අංශ මගින් සිදු කර බඳවා ගැනීම්, උසස් කිරීම්, පුහුණුව හා සංවර්ධනය, වැඩ අධ්‍යයනය සහ අනෙකුත් මානව සම්පත් කළමනාකරණ කාර්යයන් අදාල අංශ ප්‍රධානීන්ගේ වගකීම යටතේ සිදු කරනු ලබයි. ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ පාලන අංශය, පුහුණු අංශය, විභාග අංශය වැනි අංශ මගින් මෙම කටයුතු සිදු කෙරේ. එම නිසා මෙම අංශවලට අදාළ කාර්යයන් පෙළ ගස්වා විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරමින් පවතී. මේ සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගැනීමටද කටයුතු කර ඇත
04.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	මූලස්ථාන මට්ටමින් කාර්ය සාධන ගිවිසුම් සකසා ගිවිසුම්ගත කිරීම සිදු වුවද පළාත්බදව එය නිසි පරිදි සිදු නොවන බවට නිරීක්ෂණය වී ඇත. අදාල ගිවිසුම් පත්‍ර ප්‍රාදේශීය කාර්යාල වෙත නිකුත් කර තිබුණ ද එයින් විමසන ඇතැම් කරුණුවල ඇති අපැහැදිලිභාවය හා සංකීර්ණතාවය නිසා එකී ගිවිසුම් අත්සන් කිරීම තව දුරටත් ප්‍රමාද වී ඇත. මෙම හේතුවෙන් එම ගිවිසුම්පත්‍ර නිවැරදිව සම්පූර්ණ කිරීම සඳහා කාර්ය මණ්ඩලයට අවශ්‍ය දැනුම් ලබා දීම සඳහා විධිමත් පුහුණුවක් ලබා දීමට අවශ්‍ය බව හඳුනාගෙන ඇති අතර ඒ සඳහා පුහුණු අංශය මගින් විශේෂ පුහුණු වැඩසටහනක් පැවැත්වීමටද සැලසුම් කර ඇත. මේ සඳහා දැනටමත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමග සම්බන්ධ වී මූලික කටයුතු සිදු කරමින් පවතී.
05.	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුනි.	2020 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වී ඇත. කොවිඩ් 19 අවදානම් තත්ත්වයපහව ගිය පසුව පවත්වන ලද පුහුණු වැඩසටහන් ප්‍රමාණය ක්‍රමානුකූලව වර්ධනය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මේ වන විට සැලසුම්වලට අනුව සාමාන්‍ය පරිදි පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

ආර්. ඩී. ඒ. ඒ. රාජපක්ෂ
ප්‍රධාන ගණකාධිකාරී
සැපෙල් දෙපාර්තමේන්තුව
කොළඹ 10